# විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්
# ප්‍රසාද් කාරියවසම් මහතා



විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ප්‍රසාද් කාරියවසම් මහතා 2017 අගෝස්තු මස 15 වැනි දින සිය තනතුරෙහි වැඩ භාර ගත්තේය.

මෙම තනතුරට පත් කරනු ලැබීමට පෙර ඇමරිකා එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා තානාපතිවරයා ( 2014 ජූලි මාසයේ සිට 2017 අගෝස්තු දක්වා ) වශයෙන්ද, සමගාමීව අක්ත ගන්වනු ලැබ ට්‍රිනිඩෑඩ් හා ටොබැගෝ හි ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයා ලෙසද සේවය කළ කාරියවසම් මහතා මෙක්සිකෝවේ ශ්‍රී ලංකා තානාපති ධුරය සඳහාද නම් කරනු ලැබ තිබිණි. වොෂින්ටන් නුවර පිහිටි, ඇමරිකානු රාජ්‍යයන් පිළිබඳ සංවිධානයේ නිත්‍ය නිරීක්ෂකවරයා ලෙසද කාරියවසම් මහතා කටයුතු කළේය.

1981 වසරේදී ශ්‍රී ලංකා විදේශ සේවයට බැඳුණු කාරියවසම් මහතා, 1983 සිට 1987 දක්වා ජිනීවා නුවරත්, 1989 සිට 1992 වසර දක්වා රියාද් නුවරත්, 1995 සිට 1998 දක්වා වොෂින්ටන් නුවරත්, 1998 සිට 2001 දක්වා නවදිල්ලි නුවරත්, නැවත වරක් 2001 වසරේ සිට 2004 දක්වා ජිනීවා නුවරත්, 2005 සිට 2008 දක්වා නිව්යෝර්ක් නුවරත් 2009 සිට 2014 දක්වා යළිත් වරක් නවදිල්ලි නුවරත් පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවය කළේය.

2009 වසරේ සිට 2014 දක්වා ඉන්දියාවේ නවදිල්ලි නුවර ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයා ලෙස කටයුතු කළ ඒ මහතා, ඒ හා සමගාමීව භූතානයේ සහ ඇෆ්ගනිස්ථානයේ ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙසද සමගාමීව අක්ත ගන්වනු ලැබ තිබිණි.

1998 වසරේ සිට 2001 වසර දක්වා ඉන්දියාවේ නියෝජ්‍ය ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයා වශයෙන් ප්‍රසාද් කාරියවසම් මහතා කටයුතු කරනු ලැබුවේ තානාපති නිලය දරමිනි. 2001 වසරේ සිට 2004 වසර දක්වා ජිනීවාහි එක්සත් ජාතීන් සඳහා වූ ශ්‍රී ලංකා තානාපති සහ නිත්‍ය නියෝජිතවරයා වශයෙන් කටයුතු කළ ඒ මහතා ඊට සමගාමීව ස්විට්සර්ලන්තයේ ශ්‍රී ලංකා කොන්සල් ජෙනරාල් ධුරයද, ජී - 15 සංවිධානයේ ශ්‍රී ලංකා රාජ්‍ය නායකයාගේ පෞද්ගලික නියෝජිත ධුරයද දැරීය. වතිකානු රාජ්‍යයේ ශ්‍රී ලංකා

තානාපතිවරයා වශයෙන්ද කාරියවසම් මහතා සමගාමීව අක්ත ගන්වනු ලැබ තිබිණි. වතිකානු රාජ්‍යයේ ශ්‍රී ලංකා නියෝජිතයා වශයෙන් ඔහුගේ සේවය ඇගයීමට ලක් කරමින්, අති උතුම් දෙවැනි ජුවාම් පාවුළු පාප්වහන්සේ විසින් " ග්‍රෑන්ඩ් ක්‍රොස් ඔෆ් ද ඕඩර් ඔෆ් සේන්ට් ග්‍රෙගරි ද ග්‍රේට්" යන ගෞරවනාමය ඔහුට පිරිනමනු ලැබීය.

නිව්යෝර්ක් නුවර එක්සත් ජාතීන් සඳහා වූ ශ්‍රී ලංකා තානාපතිවරයා සහ නිත්‍ය නියෝජිතවරයා වශයෙන්ද සේවය කළ කාරියවසම් මහතා ඊට සමගාමීව ජැමෙයිකාවේ සහ බහාමාස්හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් ධුරයේද, චිලී සහ කොලොම්බියාව යන රටවල ශ්‍රී ලංකා තානාපති ධුරයේද කටයුතු කළේය.
විදේශ කටයුතු අමාත්‍යාංශයේ එක්සත් ජාතීන්ගේ සහ නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාර අංශය, දේශපාලන කටයුතු, පරිපාලන, ආර්ථික කටයුතු යන අංශවල සේවය කර ඇති ඔහු අමාත්‍යාංශ ලේකම්වරයාගේ විශේෂ සහායක ලෙසද කටයුතු කර ඇත. දකුණු ආසියා කටයුතු පිළිබඳ අංශයේ අධ්‍යක්ෂ ධුරය හෙබවූ ඔහු, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රචාරක අංශයේ අධ්‍යක්ෂ ධුරයේ කටයුතු කරමින්, අමාත්‍යාංශයේ නිල ප්‍රකාශකයා ලෙසද කටයුතු කළේය. නිව්යෝර්ක් හි තානාපති ධුරයට පත් කිරීමට පෙර විදේශ කටයුතු අමාත්‍යාංශයේ ආර්ථික කටයුතු අංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස කටයුතු කළ ඒ මහතා, එහි අතිරේක ලේකම්වරයෙකු ලෙසද සේවය කර තිබේ. නවදිල්ලියේ රාජකාරි කටයුතු භාරගැනීමට පෙර විදේශ කටයුතු අමාත්‍යාංශයේ දකුණු ආසියා කටයුතු, පරිපාලන සහ බහුපාර්ශ්වීය කටයුතු අංශ භාර අතිරේක ලේකම්වරයා ලෙසද හෙතෙම ක්‍රියා කළේය.

ජිනීවා නුවර පැවති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ 53 වැනි, 54 වැනි සහ 55 වැනි සැසිවාරයන්හි ශ්‍රී ලංකාව නියෝජනය කළ අනුකල්ප නියෝජිතවරයා වූ කාරියවසම් මහතා මානව හිමිකම් කොමිසමේ 57 වැනි සහ 58 වැනි සැසිවාරයන්ට සහභාගී වූ ශ්‍රී ලංකා නිරීක්ෂණ නියෝජිත පිරිසෙහි නායකත්වය දැරීය. ඔහු එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ 59 වැනි සැසිවාරය නියෝජනය කළ ශ්‍රී ලංකා නියෝජිත පිරිසේ සාමාජිකයෙක්ද විය. එම සැසිවාරයේ උපසභාපති ධුරයට තේරී පත්වූ ඒ මහතා, එහි ප්‍රසාරිත කාර්යාංශයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කළේය. 2001 වසරේ ඩර්බන්හි පැවති වර්ගවාදයට එරෙහි ලෝක සමුළුවේ ප්‍රධාන කමිටුවේ උපසභාපති තනතුරටද ඔහු තේරී පත් විය.

2003 වසරේදී සියලුම සංක්‍රමණික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ අයිතීන් සුරැකීමේ එක්සත් ජාතීන්ගේ කමිටුවට ප්‍රසාද් කාරියවසම් මහතා තේරී පත් විය. කමිටුවේ සමාරම්භක සැසිවාරයේදී සභාපති ධුරයට තෝරාගැනුණු කාරියවසම් මහතා, 2008 වසර තෙක්ම එම තනතුර හෙබවීය. තෙවරක්ම මෙම කමිටුවට යළි තේරී පත්වූ ඔහු, 2021 දක්වා එහි සේවය කිරීමේ වරම හිමිකරගෙන තිබේ. 2004 වසරේදී මානව හිමිකම් පිළිබඳ ගිවිසුම් මණ්ඩල සභාපතිවරුන්ගේ සැසිවාරයේ සහ අන්තර් කමිටු රැස්වීම්වල සභාපතිවරයා වශයෙන් කාරියවසම් මහතා තේරී පත්විය. අත්පත් කරගනු ලැබූ භූමි ප්‍රදේශවල වාසය කරන පලස්තීන ජනතාවගේ සහ සෙසු අරාබි ජාතිකයන්ගේ මානව හිමිකම්වලට බලපෑම් කරන ඊශ්‍රායලයේ භාවිතයන් පිළිබඳව විමර්ශනය කිරීමට පත්කළ, එක්සත් ජාතීන්ගේ විශේෂ කමිටුවේ මුලසුන 2005 සිට 2008 දක්වා කාරියවසම් මහතා විසින් හොබවන ලදී.

1997 දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරයට සුළු අවි සම්බන්ධයෙන් ඉදිරිපත් කළ වාර්තාව පිළියෙළ කළ විශේෂඥයින්ගේ කණ්ඩායමේ සාමාජිකයෙකු වූ කාරියවසම් මහතා, 2004 වසරේදී නිරායුධකරණය සහ සංවර්ධනය අතර සම්බන්ධය පිළිබඳව එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරයට වාර්තා කළ රාජ්‍ය විශේෂඥයින්ගෙන් සමන්විත එක්සත් ජාතීන්ගේ කණ්ඩායමේද සේවය කළේය. 2006 වසරේ ජූලි මාසයේ නිව්යෝර්ක් නුවර පැවති, නීතිවිරෝධී සුළු අවි ආයුධ සහ සැහැල්ලු අවි ආයුධ වෙළෙඳාම වැළැක්වීම, ඒවාට එරෙහිව නැගී සිටීම සහ මුලිනුපුටා දැමීම පිණිස වූ වැඩසටහනේ ප්‍රගතිය සමාලෝචනය කළ, එක්සත් ජාතීන්ගේ සමුළුවේ මුලසුනද ඔහු හෙබවීය. ඉහළ යන න්‍යෂ්ටික ක්‍රියාකාරකම් වැළැක්වීම සහ අවිහරණය පිළිබඳ ජාත්‍යන්තර කොමිසමේ උපදේශක මණ්ඩලයේද 2008 / 2009 වසරවලදී ප්‍රසාද් කාරියවසම් මහතා සේවය කර ඇත. 2006 වසරේදී එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කවුන්සිලයේ උපසභාපතිත්වය ඉසිලූ ඔහු, එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 62 වැනි

සැසිවාරයේදී 2007 / 2008 වර්ෂ සඳහා වූ උප සභාපතිවරයා වශයෙන් තේරී පත්විය. සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ 50 වැනි සංවත්සර සැසිවාරයේදී, 2001 සිට 2002 දක්වා කවුන්සිල සභාපතිවරයා ලෙස කාරියවසම් මහතා තෝරා පත්කර ගැනිණි. 2002 වසරේ ඩාවෝස් හි පැවති ලෝක ආර්ථික සමුළුවේ වාර්ෂික සැසියද ඔහු නියෝජනය කළේය. නවදිල්ලිය මූලස්ථානය කරගත් ගෝලීය සංවර්ධන ජාලයෙහි මුලසුනද 2012 සිට 2013 දක්වා කාරියවසම් මහතා විසින් දරන ලදී.

ප්‍රසාද් කාරියවසම් මහතා 1954 වසරේ මාර්තු මස 21 වැනි දින උපත ලැබීය. විවාහකයෙකු වන ඒ මහතාට දියණියක් සහ පුත්‍රයෙක් සිටිති.